# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2024 ජූලි මස 19 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2024.07.19 දින නිකුත් කරන ලදී)**


## අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 30.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය :* මේ වගන්තිය මගින් (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 3 වන වගන්තිය මගින් සිදු කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

*3 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මහෙස්ත්‍රාත් අධිකරණයකට පැනවිය හැකි උපරිම දඩ මුදල වැඩි කිරීම වේ.

*4 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 291 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සහ (ඊ) ඡේදයේ සහ (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දඩ මුදල් ප්‍රමාණ වැඩි කිරීම වේ.

*5 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 388 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අපහාස කිරීමේ අවස්ථා සම්බන්ධයෙන් පනවනු ලැබූ දඩ මුදල් වැඩි කිරීම වේ.

*6 වන වගන්තිය :* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, එම උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන වැරදි සම්බන්ධයෙන් පනවා ඇති දණ්ඩන වැඩි කිරීම වේ.

# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්.ඞී.-ඕ 18/2021

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2024 අංක      දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1979 අංක 15 දරන පනතේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදයේ -

(අ) (i) වන අනුඡේදයේ, "රුපියල් එක් දහස් පන්සියයක්" යන වචන වෙනුවට "රුපියල් මිලියනයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ii) වන අනුඡේදයේ "රුපියල් එක් දහස් පන්සියයක්" යන වචන වෙනුවට "රුපියල් මිලියනයක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "රුපියල් එක් දහස් පන්සියයක්" යන වචන වෙනුවට "රුපියල් මිලියනයක්" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (ආ) ඡේදයේ "රුපියල් එක් දහස් පන් සියයක්" යන වචන වෙනුවට, "රුපියල් මිලියනයක්" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 291 වන වගන්තිය සංශෝධනය කිරීම*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 291 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) (ඇ) ඡේදයේ "රුපියල් දහයක්" යන වචන වෙනුවට, "රුපියල් තුන්දහසක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඊ) ඡේදයේ (i) වන, (ii) වන, (iii) වන සහ (iv) වන අනුඡේද ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන්:-

"(i) දඩ මුදල රුපියල් තුන්දහසක් ඉක්මවන නමුත් රුපියල් දසදහසක් නොඉක්මවන අවස්ථාවක දී, දින හතක කාලයක්;

(ii) දඩ මුදල රුපියල් දසදහසක් ඉක්මවන නමුත් රුපියල් විසිදහසක් නොඉක්මවන අවස්ථාවක දී, දින දාහතරක් නොඉක්මවන යම් කාලයක්;

(iii) දඩ මුදල රුපියල් විසිදහසක් ඉක්මවන නමුත් රුපියල් පනස්දහසක් නොඉක්මවන යම් අවස්ථාවක දී, මාස තුනක් නොඉක්මවන යම් කාලයක්;

(iv) දඩ මුදල රුපියල් පනස්දහසක් ඉක්මවන අවස්ථාවක දී, මාස හයක් නොඉක්මවන යම් කාලයක්;";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් දෙසිය පනහක්" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක්" යන වචන ආදේශ කිරීමෙන්.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 388 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "ඒ අධිකරණය දිසා අධිකරණයක් නම්" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට, "රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයක් සහ ඒ දඩය ගෙවීම පැහැර හැරීමේ දී එය කලින් ගෙවනු ලැබුවහොත් මිස, මාස හය දක්වා දීර්ඝ විය හැකි බරපතළ වැඩ නොමැති බන්ධනාගාරගත කිරීමක් ද ඒ වරදකරු විෂයයෙහි නියම කළ හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 388 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**6.** මෙහි උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන වැරදි සම්බන්ධයෙන් වන දණ්ඩන වැඩි කිරීමේ කාර්යය සඳහා, ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ හත්වන (7) තීරය, මෙහි උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වචන වෙනුවට, මෙහි උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය** (6 වන වගන්තිය)

| | I *තීරය* | II *තීරය* | III *තීරය* |
|---|---|---|---|
| | දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන වගන්තිය සහ වරද | ඉවත් කරනු ලබන වචන | ආදේශ කරනු ලබන වචන |
| 137 | තමා නාවික භටයකු, යුද්ධ භටයකු හෝ ගුවන් භටයකු බව විශ්වාස කරවීමේ අදහසින් එබඳු නාවික භටයකුගේ, යුද්ධ භටයකුගේ හෝ ගුවන් භටයකුගේ ඇඳුමක් ඇඳීම හෝ එබන්දකු පාවිච්චි කරන යම් සලකුණක් ගෙන යාම | රුපියල් සියයක | රුපියල් පනස්දහසක |
| 151 | කැරලි ගැසීම ආදිය පිළිබඳව ඉඩම් හිමියා හෝ පදිංචිකාරයා තොරතුරු නොදීම | රුපියල් එක් දහසක | රුපියල් දසදහසක |
| 157 | කලහ කිරීම | රුපියල් සියයක | රුපියල් දසදහසක |
| 165 | තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත රජයේ සේවකයකු විසින් කරනු ලබන විෂමාචාරය | රුපියල් පනහක | රුපියල් විසිදහසක |
| 169 | වංචනික චේතනාවෙන් රජයේ සේවකයකු විසින් පාවිච්චි කරනු ලබන ඇඳුම් හෝ සලකුණු ඇඳීම හෝ පාවිච්චි කිරීම | රුපියල් සියයක | රුපියල් විසිපන් දහසක |
| 169ඉ | ඡන්ද විමසීමක් සම්බන්ධ අල්ලස් දීම | රුපියල් පන්සියයක | රුපියල් මිලියනයක |
| | සංග්‍රහ කිරීමෙන් අල්ලස් දීමක් නම් | රුපියල් දෙසියයක | රුපියල් හත්ලක්ෂ පනස් දහසක |
| 169ඊ | ඡන්ද විමසීමක දී අයුතු බලපෑම | රුපියල් පන්සියයක | රුපියල් ලක්ෂයක |
| | ඡන්ද විමසීමක දී අන්‍යයකුගේ නාමයෙන් පෙනී සිටීම | රුපියල් තුන්සියයක | රුපියල් ලක්ෂයක |
| 169උ | ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් කරනු ලබූ අසත්‍ය ප්‍රකාශය | රුපියල් තුන්සියයක | දඩය |

| | | | |
|---|---|---|---|
| 169උෟ | ඡන්ද විමසීමක ගණන් හිලව් තැබීම පැහැර හැරීම | රුපියල් තුන්සියයක | රුපියල් ලක්ෂයක |
| 170 | රජයේ සේවකයකු විසින් සිතාසි හෝ වෙනත් නියෝග භාරදෙනු ලැබීම වැළැක්වීම සඳහා පැන ගොස් සැඟවී සිටීම | රුපියල් පණහක | රුපියල් පනස් දහසක |
| | අධිකරණයක පුද්ගලිකව පෙනී සිටීම ආදිය සඳහා සිතාසියකින් හෝ දැන්වීමකින් නියම කර ඇත්නම් | රුපියල් එක් සියයක | රුපියල් පනස් දහසක |
| 171 | සිතාසි හෝ දැන්වීමක් භාරදීම හෝ ඇලවීම වැළැක්වීම නැතහොත් එය ඇලවූ විට එය ඉන් ඉවත් කිරීම හෝ ප්‍රකාශනයක් කිරීම වැළැක්වීම | මාස එකක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දෙකම | මාස හයක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| | අධිකරණයක පුද්ගලිකව පෙනී සිටීම ආදිය සඳහා සිතාසි ආදියෙන් නියම කර ඇත්නම් | රුපියල් සියයක | රුපියල් පනස් දහසක |
| 172 | තමා ම හෝ නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ යම් ස්ථානයක පෙනී සිටිය යුතු ය, යන නීත්‍යනුකූල ආඥාවකට අකීකරු වීම හෝ බලය නොමැතිව එතැනින් පිටවීම | මාස එකක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දෙකම | මාස හයක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| | අධිකරණයක පෞද්ගලිකව පෙනී සිටීම ආදිය ආඥාව අනුව අවශ්‍ය වේ නම් | රුපියල් සියයක | රුපියල් පනස් දහසක |
| 173 | ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ භාර කරවීමට නීත්‍යනුකූලව බැඳී ඇති තැනැත්තකු විසින් එය රජයේ සේවකයකු වෙත ඕනෑකමින් ඉදිරිපත් කිරීම පැහැර හැරීම | මාස එකක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මාස හයක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| | ලේඛනය අධිකරණයකට ඉදිරිපත් කළ යුතු යයි හෝ භාර කළ යුතු යයි අවශ්‍යව ඇතොත් | රුපියල් සියයක | රුපියල් පනස් දහසක |

| | | | |
|---|---|---|---|
| 174 | දැනුම් දීමට හෝ තොරතුරු සැපයීමට නීත්‍යනුකූලව බැඳී ඇති තැනැත්තකු විසින් රජයේ සේවකයකු වෙත ඒ දැනුම්දීම හෝ තොරතුරු සැපයීම ඕනෑකමින් ම පැහැර හැරීම | මාස එකක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පණහක දඩය හෝ ඒ දෙකම | මාස හයක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| | අවශ්‍ය වූ දැනුම් දීම හෝ තොරතුරු වරදක් කිරීම ආදිය පිළිබඳව නම් | රුපියල් සියයක | රුපියල් පනස් දහසක |
| 175 | රජයේ සේවකයකුට දැනුවත්ව අසත්‍ය තොරතුරු සැපයීම | එම | මාස හයක බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනස්දහස දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 176 | රජයේ සේවකයකු විසින් දිවුරුම් දීමට යථා පරිදි නියම කරනු ලැබූ විට දිවුරුම් දීම ප්‍රතික්ෂේප කිරීම | රුපියල් සියය | රුපියල් පනස් දහසක |
| 177 | සත්‍ය ප්‍රකාශ කිරීමට නීත්‍යනුකූලව බැඳී ඇති විටක දී ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීම | එම | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනස්දහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |

| | | | |
|---|---|---|---|
| 178 | රජයේ සේවකයකුට කරන ලද ප්‍රකාශයකට අත්සන් තැබීමට නීත්‍යානුකූලව නියමිතව ඇති විටක දී එසේ අත්සන් තැබීම ප්‍රතික්ෂේප කිරීම | රුපියල් සියයක | රුපියල් විසි දහසක |
| 180 | යම් තැනැත්තකු පීඩාවට හෝ කරදරයට පත්වන පරිදි රජයේ සේවකයකු ලවා තමා නීත්‍යානුකූල බලය පාවිච්චි කරවනු පිණිස එම රජයේ සේවකයාට අසත්‍ය තොරතුරු සැපයීම | රුපියල් එක් දහසක | රුපියල් ලක්ෂයක |
| 181 | රජයේ සේවකයකුගේ නීත්‍යානුකූල බලය පිට දේපළක් ගැනීමට විරුද්ධ වීම | රුපියල් සියයක | රුපියල් පනස්දහසක |
| 182 | රජයේ සේවකයකුගේ බලය පිට විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ දේපළ විකිණීමකට බාධා කිරීම | මාස එකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 183 | පොදු කටයුතු ඉටුකිරීමේ දී රජයේ සේවකයකුට බාධා කිරීම | මාස තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිපන්දහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |

| | | | |
|---|---|---|---|
| 184 | සහාය වීමට නීතියෙන් බැඳී ඇති විට රජයේ සේවකයකුට සහාය වීම නොකර හැරීම | මාස එකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දෙකම | මාස තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| | කැඳවීම් නියෝග භාරදීමේ, අපරාධ වැළැක්වීමේ ආදියේ දී රජයේ සේවකයකු උපකාර ඉල්ලා සිටි විටක ඔහුට සහාය දීම ඕනෑකමින් ම පැහැර හැරීම | රුපියල් සියයක | රුපියල් ලක්ෂයක |
| 185 | රජයේ සේවකයකු විසින් නීත්‍යානුකූලව ප්‍රකාශ කරන ලද නියෝගයකට අකීකරු වීමෙන්, නීත්‍යානුකූලව සේවයෙහි යොදවනු ලබන තැනැත්තන් හට බාධාවක්, කරදරයක් හෝ පීඩාවක් සිදුවේ නම් එබඳු අකීකරු වීම | මාස එකක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දෙකම | මාස තුනක කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| | එබඳු අකීකරු වීමෙන් මනුෂ්‍ය ජීවිතයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාව ආදියට අන්තරායක් වෙතොත් | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් සියයක දඩය හෝ ඒ දෙකම | මාස හයක කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනස්දහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |

| | | | |
|---|---|---|---|
| 219අ | සිවිල් කැඳවීම් නියෝගයක් යටතේ කරනු ලබන නීත්‍යානුකූල අල්ලස් ගැනීමකට ප්‍රතිරෝධය පෑම හෝ ඊට බාධා කිරීම | රුපියල් සියයක | රුපියල් විසිදහසක |
| 223 | රජයේ සේවකයකු අධිකරණමය කටයුත්තක යම් අවස්ථාවක යෙදී සිටිද්දී ඕනෑකමින් ම ඔහුට නින්දා කිරීම හෝ බාධා කිරීම | රුපියල් දහසක | රුපියල් පනස්දහසක |
| 265 | විකිණීමට අදහස් කරනු ලැබූ ආහාර හෝ පාන අහිතකර පරිද්දෙන් බාල කිරීම | රුපියල් එක් සියයක | රුපියල් ලක්ෂයක |
| 266 | ආහාර හෝ පාන අහිතකර බව දැනගෙන ම ඒවා ආහාර සහ පාන වශයෙන් විකිණීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් ලක්ෂයක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 267 | විකිණීමට අදහස් කරනු ලැබූ යම් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් එහි ගුණය අඩු වන පරිදි හෝ එහි ක්‍රියාකාරිත්වය අඩු වන පරිදි හෝ එය අහිතකර වන පරිදි බාල කිරීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් ලක්ෂයක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 268 | බාල කරනු ලැබූ බව දන්නා යම් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් විකිණීම සඳහා තැබීම හෝ බෙහෙත් ශාලාවකින් නිකුත් කිරීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් ලක්ෂයක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |

| | | | |
|---|---|---|---|
| 269 | යම් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් වෙනස් බෙහෙතක් හෝ ඖෂධ සංයෝගයක් වශයෙන් දැනගෙනම විකිණීම හෝ බෙහෙත් ශාලාවකින් නිකුත් කිරීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් ලක්ෂයක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 270 | පොදු උල්පතක හෝ ජලාශයක ජලය අපවිත්‍ර කිරීම | මාස තුනක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනහක දඩය හෝ ඒ දඬුවම් දෙකම | මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බරපතළ වැඩ නැතිව බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් ලක්ෂයක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 271 | පරිසරය සෞඛ්‍යයට අහිතකර කිරීම | රුපියල් එක් සියයක | රුපියල් ලක්ෂයක |
| 272 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි අපරික්ෂාකාරී ලෙස හෝ නොසැලකිලිමත් ලෙස මහා මාර්ගයක රිය පැදවීම හෝ සතකු පිට යෑම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් එක් සියයක දඩය හෝ ඒ දඬුවම් දෙකම | රුපියල් විසිපන්දහසකට නොඅඩු වන්නා වූ ද රුපියල් පනස්දහසක් නොඉක්මවන්නා වූ ද දඩයක් ද දෙවන වරට වරදකරු කරනු ලැබීමක දී රුපියල් තිස්දහසකට |

| | | | |
|---|---|---|---|
| | | | නොඅඩු වන්නා වූ ද රුපියල් හැත්තෑදහසක් නොඉක්මවන්නා වූ ද දඩයකින් සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අත්හිටුවීමෙන් ද තෙවන වරට හෝ තදනන්තර වරදකරු කරනු ලැබීමක දී රුපියල් හැත්තෑපන්දහසකට නොඅඩු වන්නා වූ දඩයකින් හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බරපතළ වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකින් ම සහ ඔහුගේ රියදුරු බලපත්‍රය අවලංගු කිරීමෙන් ද |
| 273 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි අපරික්ෂාකාරී ලෙස හෝ නොසැලකිලිමත් ලෙස යම් යාත්‍රාවක් යාත්‍රා කරවීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනස්දහසක දඩය හෝ ඒ දඬුවම් දෙකම |

| | | | |
|---|---|---|---|
| 275 | තැනැත්තකුගේ ජීවිතයට අන්තරායදායක වන තත්ත්වයක පවතින හෝ එසේ මගීන් පටවනු ලැබූ යාත්‍රාවකින් යම් තැනැත්තකු කුලියට ජලයෙන් ගෙන යෑම | රුපියල් එක් සියයක | රුපියල් පනස් දහසක |
| 276 | යම් මහාමාර්ගයකට හෝ යාත්‍රා මාර්ගයකට අන්තරායක්, බාධකයක් හෝ හානියක් සිදු කිරීම | රුපියල් එක් සියයක දඩය | රුපියල් පනස් දහසක් දක්වා විය හැකි දඩය |
| 277 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි යම් විෂ ද්‍රව්‍යයන් පිළිබඳව කටයුතු කිරීම | රුපියල් එක් සියයක | රුපියල් පනස් දහසක |
| 278 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි ගින්දර හෝ යම් ඇවිලෙන සුලු ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනස්දහසක දඩය හෝ ඒ දඬුවම් දෙකම |
| 279 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි යම් පුපුරන ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් හැත්තෑපන්දහසක දඩය හෝ ඒ දෙකම |

| | | | |
|---|---|---|---|
| 280 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන පරිදි යම් යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් කටයුතු කිරීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනස්දහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 281 | බිඳ හෙළීමට හෝ අලුත්වැඩියා කිරීමට තමාට අයිතිය ඇති යම් ගොඩනැඟිල්ලක් කඩා වැටීමෙන් මනුෂ්‍ය ජීවිතයට අන්තරායක් විය හැකි නම්, යම් තැනැත්තකු එම අන්තරාය වැළැක්වීමට ආරක්ෂා කටයුතු යෙදීම පැහැර හැරීම | එම | මාස හයක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් පනස්දහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 282 | තමා සන්තකයෙහි සිටින යම් සතකුගෙන් මනුෂ්‍ය ජීවිතයට වන අන්තරායක් හෝ බරපතල තුවාලයක් වැළැක්වෙන පරිදි ඒ සතා රැක බලා ගැනීම පැහැර හැරීම | එම | මාස හයක් දක්වා විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙකම |
| 283 | මහජන කරදරයක් සිදු කිරීම | රුපියල් පනහක | රුපියල් විසිදහසක |
| 314 | ස්වේච්ඡාවෙන් ම තුවාල සිදු කිරීම | රුපියල් එක් දහසක | රුපියල් පනස් දහසක |

| | | | |
|---|---|---|---|
| 325 | ප්‍රකෝපයට පත් කළ තැනැත්තා හැර යම් වෙනත් තැනැත්තකුට තුවාල කිරීමේ චේතනාව නැතිව බරපතළ හදිසි කෝපයෙන් ස්වේච්ඡාවෙන් තුවාල සිදු කිරීම | රුපියල් පනහක | රුපියල් විසි දහසක |
| 326 | ප්‍රකෝපයට පත් කළ තැනැත්තා හැර යම් වෙනත් තැනැත්තකුට තුවාල කිරීමේ චේතනාව නැතිව බරපතළ හදිසි කෝපයෙන් ස්වේච්ඡාවෙන් බරපතළ තුවාල සිදු කිරීම | රුපියල් දෙදහසක | රුපියල් පනස් දහසක |
| 327 | මනුෂ්‍ය ජීවිතයට හෝ වෙනත් තැනැත්තන්ගේ පෞද්ගලික ආරක්ෂාවට හෝ අන්තරායදායක වන අන්දමට සැහැසි ලෙස හෝ නොසැලකිලිමත් ලෙස යම් ක්‍රියාවක් සිදු කිරීම | රුපියල් සියයක | රුපියල් ලක්ෂයක |
| 328 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන අන්දමේ ක්‍රියාවක් සැහැසි ලෙස හෝ නොසැලකිලිමත් ලෙස හෝ කිරීමෙන් තුවාල සිදු කිරීම | රුපියල් එක් සියයක | රුපියල් ලක්ෂයක |
| 329 | මනුෂ්‍ය ජීවිතය ආදියට අන්තරායදායක වන අන්දමේ ක්‍රියාවක් සැහැසි ලෙස හෝ නොසැලකිලිමත් ලෙස හෝ කිරීමෙන් බරපතල තුවාල සිදු කිරීම | රුපියල් එක් දහසක | රුපියල් එක් ලක්ෂ පනස් දහසක |
| 332 | යම් තැනැත්තකුට අයුතු ලෙස අවහිර කිරීම | රුපියල් පනහක | රුපියල් පනස් දහසක |
| 333 | යම් තැනැත්තකු අයුතු ලෙස සිරකර තැබීම | රුපියල් එක් දහසක | රුපියල් ලක්ෂ පහක |

| | | | |
|---|---|---|---|
| 343 | තදබල සහ හදිසි ප්‍රකෝපයකින් හැර සෙසු අවස්ථාවක දී අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධ බලහත්කාරය පෑම | රුපියල් පනහක | රුපියල් පනස් දහසක |
| 348 | යම් තැනැත්තකු අයුතු ලෙස සිර කර තැබීමට තැත් කිරීමේ දී අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධ බලහත්කාරකම් පෑම | රුපියල් දහසක | රුපියල් ලක්ෂ පහක |
| 349 | තදබල හදිසි ප්‍රකෝපනයකින් අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධ බලහත්කාරය පෑම | රුපියල් පනහක | රුපියල් විසිදහසක |
| 433 | සාපරාධ අයුතු ඇතුළුවීම | රුපියල් එක් සියයක | රුපියල් ලක්ෂයක |
| 434 | ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම | රුපියල් එක් දහසක | රුපියල් එක් ලක්ෂ පනස් දහසක |
| 450 | නීති විරෝධී කාර්යයක් සඳහා ගොඩනැගිල්ලක සිට අසුවීම | රුපියල් පනහක | රුපියල් විසිදහසක |
| 451 | ප්‍රසිද්ධ හොරෙකු නිකරුණේ ගැවසීම | එම | මාස තුනක් දක්වා වූ කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් විසිදහසක් දක්වා විය හැකි දඩය හෝ ඒ දෙක ම |